# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2021/28 - 2017 මැයි මස 31 වැනි බදාදා - 2017.05.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 9/2014.

### 1968 අංක 32 පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත

1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 52 වැනි වගන්තිය යටතේ අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන,
සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා.

2017 මැයි මස 30 දින,
බත්තරමුල්ලේ දී ය.

නියෝග

1. මේ නියෝග 2017 පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ නියෝග අංක 1 යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) පනතේ 6 (1) වැනි වගන්තියේ කාර්යයන් සඳහා ජාතික පුද්ගල නාම ලේඛනය උපලේඛනයේ දක්වා ඇති පරිදි 'උ෴' ආකෘතියෙන් විය යුතුය.

(2) කොමසාරිස් ජනරාල්වරයා විසින් පුද්ගලයන් පිළිබඳ ජාතික නාම ලේඛනය ඉලෙක්ට්‍රොනික ලේඛනයක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක ආකෘතියෙන් පවත්වාගෙන යනු ලැබිය යුතුය.

(3) පනතේ 6 (2) වැනි වගන්තියේ කාර්යය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් පුද්ගලයන් පිළිබඳ ජාතික නාම ලේඛනයේ එක් එක් ඉල්ලුම්කරු සම්බන්ධයෙන් පහත දැක්වෙන තොරතුරු ඇතුළත් කරනු ලැබිය යුතුය :-

(අ) නම ;
(ආ) උපන් දිනය ;
(ඇ) උපන් ස්ථානය ;
(ඈ) ස්ත්‍රී පුරුෂ භාවය ;
(ඉ) ලිපිනය ;
(ඊ) පවුලේ තොරතුරු ; සහ
(උ) දෙමව්පියන්ගේ, භාරකරුගේ, කලත්‍රයාගේ, ළමයින්ගේ සහ සහෝදර සහෝදරයන්ගේ ජාතික හැඳුනුම්පත් අංක.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. පනතේ 6 වැනි වගන්තියේ කාර්යයන් සඳහා තොරතුරු සපයනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු විසින් ද ඒ සෑම තැනැත්තකු විසින් ම -

(1) පුද්ගලයන් පිළිබඳ ජාතික නාම ලේඛනයේ ඇතුළත් කළ යම් තොරතුරක වෙනස්කමක් මෙහි උපලේඛනයේ දක්වා ඇති 'ඒ' ආකෘතියට සාරානුකූලව වූ ප්‍රකාශයක් මගින් ඒ වෙනස්කම සිදු වූ දින සිට මාස හයක කාල සීමාවක් තුළ දී කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතුය.

(2) ලියාපදිංචි කිරීමක් හෝ නැවත ලියාපදිංචි කිරීමක් සිදුකිරීමෙන් පසුව පැවිදි වී ඇති හෝ උපැවිදි වී ඇති වයස අවුරුදු 15 ට අඩු ළමයකු සම්බන්ධයෙන් වූ විටක දී ඒ පූජකවරයාගේ දෙමව්පියන් හෝ නීත්‍යානුකූල භාරකාරයා විසින් මෙහි උපලේඛනයේ 'ඒ' ආකෘතියට සාරානුකූල වූ ප්‍රකාශයක් මගින් ඒ සිදුවීම සිදු වී මාස හයක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

4. පුද්ගලයන් පිළිබඳ ජාතික නාම ලේඛනය යාවත්කාලීන කිරීමේ කාර්යය සඳහා පනත යටතේ ලියාපදිංචි කරනු ලැබීමෙන් පසුව හෝ නැවත ලියාපදිංචි කරනු ලැබීමෙන් පසුව පහත දැක්වෙන සිදුවීම් සිදුවන අවස්ථාවක දී ඒ වෙනස සිදු වී මාස හයකට නොඅඩු කාල සීමාවක දී මෙහි උපලේඛනයේ දක්වා ඇති 'ඒ' ආකෘතියට සාරානුකූලව වූ ප්‍රකාශයක් මගින් පහත දැක්වෙන තැනැත්තන් විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(i) දරු උපතක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී ස්වභාවික මව්පියන් විසින් ;
(ii) දරුකමට හදාගන්නා දරුවකු සම්බන්ධයෙන් දරුකමට හදාගන්නා තැනැත්තා ;
(iii) යම් තැනැත්තකුගේ විවාහයක් සම්බන්ධයෙන් වන විටක දී ඒ තැනැත්තා විසින් ;
(iv) යම් තැනැත්තකුගේ දික්කසාදයක් සම්බන්ධයෙන් වන විට, ඒ තැනැත්තා විසින් ;
(v) කලත්‍රයාගේ මරණය සම්බන්ධයෙන් වන විටක දී ජීවත්ව සිටින කලත්‍රයා හෝ ආසන්නතම ඥාතියා විසින් ;

5. පනතේ 2 සහ 7 (4) වගන්තිවල කාර්යයන් සඳහා -

(අ) නියමිත දිනයේ දී හෝ ඉන් පසුව ශ්‍රී ලංකාවට ඇතුළුවන සහ මේ පනත යටතේ ලියාපදිංචි කිරීමට යටත් වන්නා වූ පුරවැසියකු ඒ තැනැත්තා ශ්‍රී ලංකාවට පැමිණි දින සිට මාස හයක කාල සීමාවක් තුළ දී ලියාපදිංචි කිරීම හෝ නැවත ලියාපදිංචි කිරීම සඳහා සහ ජාතික හැඳුනුම්පතක් ලබාගැනීම සඳහා ඉල්ලුම් කළ යුතු ය.

(ආ) පනතේ 2 වැනි වගන්තිය ප්‍රකාරව ලියාපදිංචි වීමට යටත් නොවන්නා වූ ද, පසුව එසේ ලියාපදිංචි වීමට යටත්වන්නා වූ ද තැනැත්තකු විසින් එසේ ලියාපදිංචි වීමට යටත් වන්නාවූ දින සිට මාස හයක් ඇතුළත ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කළ යුතු ය.

(ඇ) 7 (1) වැනි වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියමය පල කළ දිනයට පසු වයස අවුරුදු පහළොවට එළඹෙන සහ මේ පනත යටතේ ලියාපදිංචි වීමට යටත්වන සෑම තැනැත්තකු ම, ඒ තැනැත්තා වයස අවුරුදු පහළොවට එළඹෙන දින සිට එක් අවුරුද්දක් ඇතුළත ලියාපදිංචි වීම සඳහා සහ ජාතික හැඳුනුම්පතක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කළ යුතු ය.

6. (1) පනතේ 9 (2) (ආ) වගන්තියේ කාර්ය සඳහා -

(අ) ලියාපදිංචි කිරීමට යටත් වන ;

(ආ) නැවත ලියාපදිංචි වීමට යටත් වන,

යම් තැනැත්තකු ජාතික හැඳුනුම්පතක් ලබා ගැනීමේ කාර්යය සඳහා මෙයට අමුණා ඇති උපලේඛනයේ දක්වා ඇති 'ඒ' ආකෘතියට සාරානුකූලව කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලුම් කළ යුතු ය.

(2) පනතේ 9 (2) (ආ ආ) (i) වගන්තියේ කාර්යයන් සඳහා ගෙවීම සිදුකරන අවස්ථාවකදී, ඒ ගෙවීම් අදාළ ඉල්ලුම්කරුවන් විසින් නියමිත වටිනාකමට සරිලන මුද්දර ඉල්ලුම් පත්‍රයේ ඇලවීමෙන් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් උපදෙස් ලබා දෙන ආකාරයට පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයාගේ ගිණුමට බැරවන පරිදි, මුදල්වලින්, චෙක්පත් මගින් හෝ විද්‍යුත් මුදල් හුවමාරු ක්‍රමයක් මගින් ගෙවීම් කළ යුත්තේය.

(3) පනතේ 9 (2) (ඉ) වගන්තියේ කාර්යයන් සඳහා සහතික කිරීමේ නිලධරයාගේ පිටසන මෙහි උපලේඛනයේ දක්වා ඇති 'ඕ' ආකෘතියට අනුව විය යුතු ය.

7. (1) පනතේ 9, වැනි 16 වැනි සහ 17 වැනි වගන්තිය යටතේ ජෛවමිතික දත්ත ලබාගැනීමේ කාර්යය සඳහා ඉල්ලුම්කරුවන්ගේ අත් දෙකෙහිම ඇඟිලි සලකුණු ලබාදිය යුතු ය.

(2) මේ පනතේ 9 වැනි, 16 වැනි සහ 17 වැනි වගන්තිවල කාර්යයන් සඳහා භාරදීමට නියම කරන ලද සෑම ඡායා රූපයක් ම පහත දැක්වෙන පරිමාණයන්ට, පිරිවිතරවලට, ප්‍රමිතියන්ට සහ තත්වයන්ට අදාළ විය යුතු ය :-

(i) ඡායාරූප ප්‍රමාණය මි.මී. 35 පළල x මි.මී. 45 උස විය යුතු අතර ඡායාරූපයේ ප්‍රමිතිය පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා විසින් සපයනු ලබන මෘදුකාංගය හෝ උපදෙස් අනුව විය යුතු ය ;

(ii) මුහුණේ ඇස් විවෘතව හා පැහැදිලිව පෙනෙන පරිදි ද, මුඛය වසා සිනහාවීමෙන් තොරව ද, කිසිදු හැඟීමක් පළ නොකරන මධ්‍යස්ථ ඉරියව්වෙන් යුක්තව ද විය යුතු ය ;

(iii) හිසකෙස් මුහුණට නොවැටෙන පරිදි තිබිය යුතු අතර මුහුණේ කෙළවර තෙක් දිස්විය යුතු ය ;

(iv) (අදාළ වේ නම්) ඇස් කණ්ණාඩි වීදුරුවලින් කිසිදු ප්‍රතිබිම්බයක් දිස් නොවිය යුතු ය. කාච තුළින් ඇස් පැහැදිලිවම දර්ශනය විය යුතු අතර පැහැදිලි කාච (අඳුරු නොකරන ලද) පමණක් පැළඳිය යුතු ය ;

(v) ආලෝකය ඒකාකාරී විය යුතු අතර සෙවනැලි, දිලිසීම හෝ ක්ෂණිකාලෝක පරාවර්තන දර්ශනය නොවිය යුතු ය ;

(vi) නිරාවරණය හා ඡායාරූපයේ සුදු පැහැයේ තුලනය අයදුම්කරුගේ සමේ ස්වභාවික වර්ණ සංයෝගය පිළිඹිබු කළ යුතු ය ;

(vii) ඡායා රූපයට පෙනී සිටින ආකාරය, කැමරාවට කෙළින්ම මුහුණලා, මුහුණ හා උරහිස් ඡායා රූපයේ මැද පිහිටන පරිදි විය යුතු ය ;

(viii) පසුතලය ඒකාකාරීව, පැහැදිලිව ආකෘතික ස්වරූපයෙන් තොරව, ලා නිල් වර්ණයෙන් තිබිය යුතු ය ;

(ix) පිළිඹිබුව පැහැදිලි තියුණු සහ නාභිගත විය යුතු ය ;

(x) වෘත්තිමය මුද්‍රණ රසායනාගාරයක් භාවිත කරමින් ඡායාරූප වර්ණයෙන් මුද්‍රණය කර තිබිය යුතු ය ;

(xi) ඡායාරූප කිසිඳු ආකාරයකින් වෙනස් කර නොතිබිය යුතු අතර එම ඡායාරූපය අයදුම්කරුගේ ස්වභාවික තත්ත්වය පිළිබිඹු කරන ඡායාරූපයක් විය යුතු ය.

8. 11 (4) වැනි වගන්තියේ කාර්යයන් සඳහා ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීමෙන් පසුව කොමසාරිස් ජනරාල්වරයා විසින් ජාතික හැඳුනුම්පත සමඟ ඉල්ලුම්පත්‍රය සහ අදළ ලේඛන ලියාපදිංචි තැපෑලෙන් ආපසු යැවීම හෝ අතින් භාරදීම හෝ රජයේ ආයතනයකට හෝ වෙනත් යම් රජය විසින් අනුමත කරන ලද ආයතනයකට භාරදීම මඟින් විනාශ කිරීමට කටයුතු කළ යුතු ය.

9. පනතේ 14 (අ) වගන්තියේ කාර්යය සඳහා -

(1) (අ) ජාතික හැඳුනුම්පත මෙහි උපලේඛනයේ දක්වා ඇති 'ඕ' ආකෘතියට සාරානුකූල විය යුතු ය ;

(ආ) ජාතික හැඳුනුම්පතේ වලංගු කාල සීමාව එය නිකුත් කළ දින සිට වසර දහයක් විය යුතු ය ඃ

එසේ වුව ද ජාතික හැඳුනුම්පතක් නිකුත් කරනු ලබන දිනයේ දී වයස අවුරුදු හතළිහක් ඉක්මවන තැනැත්තකු සඳහා ජාතික හැඳුනුම්පතේ වලංගු කාල සීමාව අදළ නොවිය යුතු ය.

(2) ජාතික හැඳුනුම්පතක වලංගු කාලය කොමසාරිස් ජනරාල්වරයා විසින් යම් තැනැත්තකුගේ පුරවැසිභාවය සම්බන්ධයෙන් යම් හදිසි තත්වයක දී සීමා කරනු ලැබිය හැකිය.

10. පනතේ 15 (1) වැනි වගන්තියේ කාර්ය සඳහා නියමිත නිලධරයන් පහත දක්වෙන පරිදි විය යුතු ය :-

(අ) යම් දිස්ත්‍රික්කයක පරිපාලන දිස්ත්‍රික් ලේකම්වරයා ;
(ආ) යම් පරිපාලන දිස්ත්‍රික්කයක අතිරේක දිස්ත්‍රික් ලේකම්වරයකු ;

(ඇ) යම් දිස්ත්‍රික්කයක සහකාර දිස්ත්‍රික් ලේකම්වරයකු ;

(ඈ) යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක ප්‍රාදේශීය ලේකම්වරයා ;

(ඉ) යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක සහකාර ප්‍රාදේශීය ලේකම්වරයකු ;

(ඊ) යම් ග්‍රාම නිලධාරි කොට්ඨාසයක ග්‍රාම නිලධාරිවරයා ;

(උ) කම්කරු කොමසාරිස් ජනරාල්වරයා ;

(ඌ) කම්කරු කොමසාරිස්වරයකු ;

(එ) නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරයකු ;

(ඒ) සහකාර කම්කරු කොමසාරිස්වරයකු ;

(ඔ) කම්කරු නිලධරයකු ;

(ඕ) 1948 අංක 20 දරන ආගාමික සහ විගාමික පනතේ 7අ වගන්තිය යටතේ බලයලත් හමුද සාමාජිකයකු වශයෙන් පදවි නාමලත් ශ්‍රී ලංකා යුධ හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු ;

(ක) 1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනතේ 4 වැනි වගන්තිය යටතේ පත්කරනු ලැබූ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල්, අතිරේක පාලක ජනරාල්, පාලක, නියෝජ්‍ය පාලක, සහකාර පාලක හෝ බලයලත් නිලධරයකු ;

(ග) ඕනෑම නිලයක පොලිස් නිලධරයෙක් ;

(ච) සාම නිලධරයෙක් ;

(ජ) තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ විමර්ශන නිලධරයෙක් ;

(ට) ශ්‍රී ලංකාව වෙනුවෙන් විදේශයකට පත් කරනු ලැබූ යම් විදේශ දූතමණ්ඩල නිලධරයෙක් ; හෝ

(ඩ) විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග කටයුතු සඳහා පත් කරනු ලැබූ යම් නිලධරයෙක්.

11. පනතේ 16 වැනි වගන්තියේ කාර්යයන් සඳහා -

(අ) නැතිවූ ජාතික හැඳුනුම්පතක අනුපිටපතක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන සෑම ඉල්ලුම්පතක්ම මෙහි උපලේඛනයේ දැක්වෙන 'ක' ආකෘතියට සාරානුකූල විය යුත්තේ ය ;

(ආ) (2) (ආ) වැනි උපවගන්තිය යටතේ ගෙවීම් සිදුකිරීමේ ආකාරය ඉහත නියෝග අංක 6 (2) හි සඳහන් පරිදි විය යුත්තේ ය ;

(ඇ) (2) (ඇ) වැනි උපවගන්තියේ කාර්යයන් අදළ වන ජෛවමිතික තොරතුරු හා ඡායාරූප ඉහත නියෝග අංක 7 හි දක්වා ඇති ආකාරයට විය යුත්තේ ය.

12. 17 වැනි වගන්තියේ කාර්යයන් සඳහා -

(අ) (2) (අ) වැනි උපවගන්තිය යටතේ ජාතික හැඳුනුම්පතක අනුපිටපතක් ලබා ගැනීම සඳහා වන සෑම ඉල්ලුම්පත්‍රයක්ම මෙහි උපලේඛනයේ දැක්වෙන 'ක' ආකෘතියට සාරානුකූල විය යුත්තේ ය ;

(ආ) (2) (අඅ) වැනි උපවගන්තියේ කාර්යයන් සඳහා ගෙවීම් කරන ආකාරය ඉහත නියෝග අංක 6 (2) හි දක්වා ඇති ආකාරයට විය යුත්තේ ය ;

(ඇ) (2) (ඇ) වැනි උපවගන්තියේ කාර්යයන් සඳහා අදළ වන ජෛවමිතික තොරතුරු හා ඡායාරූප ඉහත නියෝග අංක 7 හි දක්වා ඇති ආකාරයට විය යුත්තේ ය.

13. (1) පනතේ 17 (4) වැනි උපවගන්තියේ කාර්යයන් සඳහා ජාතික හැඳුනුම්පතක වලංගු කාලසීමාව ඉකුත් වී මාස හයක් කල් ගතවීමට ප්‍රථම එය දරන්නා විසින් නව ජාතික හැඳුනුම්පතක් ලබා ගැනීම පිණිස උපලේඛනයේ දැක්වෙන 'ක' ආකෘති පත්‍රයට සාරානුකූලව ඉල්ලුම්පත්‍රයක් මගින් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලුම් කළ යුත්තේය.

(2) (1) වැනි ඡේදය යටතේ භාරදෙන ලද ඉල්ලුම්පත්‍රයකට අදාළව ගෙවීම් කරන ආකාරය ද ඡායාරූප හා ජෛවමිතික තොරතුරු ද පිළිවෙලින් 6 (2) වැනි හා 7 වන නියෝග මඟින් දක්වා ඇති ආකාරයට විය යුත්තේ ය.

14. කොමසාරිස් ජනරාල්වරයා විසින් පහත දැක්වෙන අවස්ථාවල දී කලින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත අවලංගු කළ යුතු ය :-

(අ) 11 වැනි හෝ වැනි නියෝගවල සඳහන් පරිදි ජාතික හැඳුනුම්පතේ අනුපිටපතක් නිකුත් කරන අවස්ථාවකදී ;
(ආ) 15 වැනි හෝ 16 වැනි නියෝගවල සඳහන් පරිදි ජාතික හැඳුනුම්පත් කොමසාරිස් ජනරාල්වරයාගේ භාරයට ගත් අවස්ථාවකදී ;

(ඇ) 17 වැනි නියෝගයේ සඳහන් පරිදි ජාතික හැඳුනුම්පත දරන තැනැත්තා ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටීම අවසන් වීමෙන් පසුව එකී ජාතික හැඳුනුම්පත කොමසාරිස් ජනරාල්වරයාට භාරදෙන අවස්ථාවක දී ;

(ඈ) ජාතික හැඳුනුම්පතක වලංගු කාල සීමාව ඉකුත්වන දින සිට මාස හයක කාල සීමාවක් ගතවීමෙන් පසුව.

15. පනතේ 18 (1) (ආ) වගන්තියේ කාර්යයන් සඳහා නැති වූ ජාතික හැඳුනුම්පතක් වෙනුවට එහි අනුපිටපතක් නිකුත් කිරීමෙන් අනතුරුව එකී නැති වූ ජාතික හැඳුනුම්පත දරන්නා විසින් නැවත සොයාගනු ලබන අවස්ථාවක දී, අවලංගු කිරීම සඳහා එය කොමසාරිස් ජනරාල්වරයා වෙත ආපසු භාරදීම, එසේ සොයාගත් දින සිට මාසයක් ඇතුළත සිදු කළ යුතු ය.

16. පනතේ 19 (1) වගන්තියේ කාර්යයන් සඳහා මරණ ලියාපදිංචි කිරීමේ ලේකම්වරයා විසින් තම කොට්ඨාසය තුළ ලියාපදිංචි කරන මරණ සම්බන්ධයෙන් මිය ගිය තැනැත්තාගේ ළඟම ඥාතියාගෙන් ලබාගත් ජාතික හැඳුනුම්පත, අදාළ තැනැත්තාගේ මරණය සිදු වූ දිනය, නිකුත් කළ මරණ සහතිකයේ අංකය හා කොට්ඨාසය සඳහන් වාර්තාවක් සමඟ කොමසාරිස් ජනරාල්වරයා වෙත හෝ ඔහු විසින් ඒ සඳහා නියම කරනු ලබන නිලධරයෙකු වෙත ඉදිරිපත් කළ යුත්තේ ය.

17. පනතේ 19 (2) වැනි වගන්තියේ කාර්යයන් සඳහා 1948 අංක 18 දරන පුරවැසිභාවය පිළිබඳ පනතේ 19, 20 හෝ 21 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම අවසන් කළ තැනැත්තකු විසින් ස්වකීය ශ්‍රී ලංකා පුරවැසිභාවය අවසන්වී මාස හයක් ගත වීමට ප්‍රථම මෙහි උපලේඛනයේ දැක්වෙන 'ග' ආකෘතිය ප්‍රකාර ප්‍රකාශනයක් ද සහිතව තමන් වෙත නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත, කෙළින් ම හෝ විදේශයක පිහිටි ශ්‍රී ලංකා දූතමණ්ඩල කාර්යාලයක් මඟින් හෝ 1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව පත්කරනු ලැබූ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් වෙත, අතිරේක පාලක ජනරාල් වෙත, නියෝජ්‍ය පාලක, සහකාර පාලක වෙත හෝ බලයලත් නිලධරයකු වෙත හෝ කොමසාරිස් ජනරාල්වරයා වෙත ලැබීමට සලස්වනු ලැබිය යුත්තේ ය.

18. පනතේ 39අ (1) වැනි වගන්තියේ කාර්යයන් සඳහා 'නියමිත බලධරයන්' යන්න රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් විය යුත්තේ ය.

19. සෑම උප්පැන්න, විවාහ හා මරණ ලියාපදිංචි කිරීමේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයකු විසින් ම ස්වකීය බල ප්‍රදේශය තුළ සිදුවන උපත්, විවාහ හා මරණ පිළිබඳ මාසික වාර්තාවක් ඒවාට අදළ නම්, ජාතික හැඳුනුම්පත් අංක, හා සහතික අංකයන්ද සහිතව කොමසාරිස් ජනරාල්වරයා වෙත හෝ ඔහු විසින් නියම කරනු ලබන යම් නිලධරයකු වෙත සපයනු ලැබිය යුත්තේ ය.

20. (1) පනතේ 39ආ වගන්තියේ කාර්යයන් සඳහා 'නියමිත නිලධරයකු' යන්න

(අ) අතිරේක කොමසාරිස් ජනරාල්වරයා ;

(ආ) කොමසාරිස්වරයකු ;

(ඇ) 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 3 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පත්කරනු ලැබූ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස්වරයකු හෝ සහකාර කොමසාරිස්වරයකු විය යුත්තේ ය.

(2) පනතේ 39ආ වගන්තියේ සඳහන් කරන ලද ජාතික හැඳුනුම්පතක සත්‍යතාවය සම්බන්ධයෙන් සහතිකයක් නිකුත් කිරීම සඳහා වූ ගාස්තුව රුපියල් පන්සියයක් විය යුතු ය.

(3) පනතේ 39ආ වගන්තියේ (ඇ) ඡේදයේ කාර්යයන් සඳහා 'නියමිත බලධරයා' යන්නෙන් ශ්‍රී ලංකාවේ පිහිටි බැංකුවක, මූල්‍ය ආයතනයක, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, රජයට පවරාගත් ආයතනයක හෝ යම් ලිඛිත නීතියක් යටතේ ශ්‍රී ලංකාව තුළ පිහිටුවනු ලැබූ ආයතනයක නිසි බලධරයෙක් අදහස් වේ.

21. පනත යටතේ කාර්යයන් සඳහා අවශ්‍ය ඡායාරූප, කොමසාරිස් ජනරාල්වරයා විසින් එම කාර්යය සඳහා ලියාපදිංචි කරනු ලැබූ ඡායාරූප ශිල්පියකු විසින් හෝ ඡායාරූප ගැනීමේ කාර්යය සඳහා කොමසාරිස්වරයා විසින් බලය පවරන ලද නිලධරයකු විසින් ගත යුත්තේ ය.

22. (1) මේ පනතේ 52 (2) (ඉ) (ii) වගන්තියේ කාර්යය සඳහා, වෘත්තීය ඡායාරූප ශිල්පියෙකු වන යම් තැනැත්තකු විසින්, පනත යටතේ ලියාපදිංචි කිරීම සහ ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා ඡායාරූප ගැනීමේ කාර්යය සඳහා ඡායාරූප ශිල්පියෙකු වශයෙන් ලියාපදිංචි වීමට කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

(2) ඉල්ලුම්කරු විසින් -

(අ) 7 (2) වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමිතිවලට එකඟව ඡායාරූප ගැනීම පිළිබඳව ස්වකීය ශක්‍යතාවය පිළිබඳව ; සහ

(ආ) ඡායාරූප ගැනීම සඳහා අවශ්‍ය නියමිත උපකරණ ඉල්ලුම්කරු සන්තකයේ පවතින බව සනාථ කරනු ලැබිය යුතු ය.

(3) මේ නියෝග ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව වූ දිනයේදී ලියාපදිංචි ඡායාරූප ශිල්පියකු වශයෙන් ලියාපදිංචි වී ඇති සෑම තැනැත්තකුම විසින්, මේ නියෝග ක්‍රියාත්මක වන දින සිට එක් අවුරුදු කාල සීමාවක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා වෙත නැවත ලියාපදිංචි විය යුතු ය.

23. ලියාපදිංචිය සඳහා ඉල්ලුම්කරනු ලබන යම් ඡායාරූප ශිල්පියෙකු කොමසාරිස් ජනරාල්වරයා විසින් ලියාපදිංචි කිරීම හෝ තත්කාර්යය සඳහා හේතු දක්වමින් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ කරනු ලැබිය හැකිය.

24. (1) කොමසාරිස් ජනරාල්වරයා විසින් එම සහතිකයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, ලියාපදිංචි සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) ලියාපදිංචි සහතිකය නිකුත් කර ඇත්තේ යම් නියම හෝ කොන්දේසිවලට යටත්ව ද, එම නියම හෝ කොන්දේසි උල්ලංඝනය වීමක් හෝ සම්පූර්ණ නොවීමක් සිදුව ඇති අවස්ථාවකදී, කොමසාරිස් ජනරාල්වරයා විසින් ලියාපදිංචි සහතිකය අවලංගු කරනු ලැබිය හැකිය :

එසේ වුවද, එම අවලංගු කිරීමට පෙරාතුව එම සහතිකය නිකුත් කර ඇත්තේ යම් තැනැත්තකු වෙත ද, එම තැනැත්තාට සවන් දීම සඳහා අවස්ථාවක් ලබා දිය යුතු ය.

(3) යම් ලියාපදිංචි සහතිකයක් නිකුත් කළ දින සිට එක් අවුරුදු කාලයක් සඳහා වලංගු වන්නේ ය.

(4) ඡායාරූප ශිල්පියකු වෙත නිකුත් කරනු ලබන සෑම ලියාපදිංචි සහතිකයක්ම වාර්ෂිකව අලුත් කරනු ලැබිය යුතු ය.

25. (1) පනත යටතේ ඡායාරූප ශිල්පියෙකු වශයෙන් යම් තැනැත්තකු ලියාපදිංචි කිරීම සඳහා ලියාපදිංචි ගාස්තුව රුපියල් දසදහසක් විය යුතු ය.

(2) ලියාපදිංචි සහතිකයක් නැවත අලුත් කිරීම සඳහා වාර්ෂික ගාස්තුව රුපියල් දෙදහසක් විය යුතු ය.

26. පනත යටතේ ඡායාරූප ශිල්පියෙකු වශයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් ලියාපදිංචි කරනු ලබන සෑම තැනැත්තකු වෙතම මෙහි උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති 'ච' ආකෘතියට සාරානුකූලව ලියාපදිංචි සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

27. 1990 නොවැම්බර් 20 වන දින අංක 637/6 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1990 පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ අලුත් හැඳුනුම්පත් නිකුත් කිරීමේ නියෝගය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ :

එසේ වුවද 1971 දෙසැම්බර් මස 30 වැනි දින අංක 14991 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 1971 පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ නියෝග, 2005 මාර්තු 29 වැනි දින අංක 1386/17 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2005 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ නියෝග සහ 2015 දෙසැම්බර් මස 22 වැනි දින අංක *1946/31* දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2015 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ නියෝග 2016 අංක 8 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතේ 34 වැනි වගන්තිය ප්‍රකාරව අවශ්‍ය යටිතල පහසුකම් වැඩපිළිවෙල සහ තාක්ෂණික ක්‍රමවේද සකස් කරන තුරු බලාත්මක විය යුතු ය.

28. මේ නියෝගවල -

''පනත'' යන්නෙන් සංශෝධිත පරිදි 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත අදහස් වේ ;

''කොමසාරිස් ජනරාල්වරයා'' යන්නෙන් 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 3 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පත් කරනු ලැබූ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ ;

''ඉලෙක්ට්‍රොනික ලේඛන හෝ ඉලෙක්ට්‍රොනික වාර්තා'' යන්නට 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනතේ ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය.

(2 වන නියෝගය)

## උපලේඛනය

### "ඌ" ආකෘතිය

### <u>ජාතික පුද්ගල නාම ලේඛනය</u>

| 1<br>අනු අංකය | 2<br>ඉල්ලුපත් අංකය | 3<br>ඉල්ලුම්පත ලැබුණු දිනය | 4<br>දිස්ත්‍රික්කය | 5<br>ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය<br>6<br>අංකය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය<br>7<br>නම | 8<br>පළාත | 9<br>පුද්ගලයාගේ නම | 10<br>උපන් දිනය | 11<br>උපන් ස්ථානය | 12<br>ස්ත්‍රී/පුරුෂ භාවය | 13<br>ලිපිනය | 14<br>ජාතික හැඳුනුම්පත් අංකය | 15<br>නිකුත්කළ දිනය | 16<br>ඉල්ලුම්-කරුගේ ඡායාරූපය | 17<br>කොමසාරිස් ජනරාල්ගේ අත්සන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | |

(6(1) වන නියෝගය)

**පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව**

| මුද්‍රිත පිළිවෙළ අංකය |
|---|

"එ ආකෘතිය"

**1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීම් පනතේ 9 වැනි වගන්තිය යටතේ**

***මුල්වරට ලියාපදිංචි වී / නැවත ලියාපදිංචි වී විද්‍යුත් ජාතික හැඳුනුම්පතක් ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත***

1. කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

| 1.1 | | 1.2 | | 1.3 | |
|---|---|---|---|---|---|

| 1.4 | | | | | |
|---|---|---|---|---|---|
| ඉල්ලුම්පත | QR Code | අනුමාන වයස් සහතිකය | QR Code | ලේඛන සෙවීමේ ප්‍රතිඵල සටහන | QR Code |
| ඡායාරූපය | QR Code | උපසම්පද/සාමණේර/ පැවිදි/ උපැවිදි සහතිකය | QR Code | විවාහ සහතිකය | QR Code |
| ඇඟිලි සටහන් පත්‍රය | QR Code | සේවා සහතිකය | QR Code | නම, උපන් දිනය සඳහා විකල්ප ලේඛනයක් | QR Code |
| උප්පැන්න සහතිකය | QR Code | දිවුරුම් ප්‍රකාශය | QR Code | කුවිතාන්සිය | QR Code |

මෙම ඉල්ලුම්පත පිරවීමට පෙර උපදෙස් පත්‍රිකාව කියවා එහි ඇති උපදෙස් අනුව ඉල්ලුම්පත සම්පූර්ණ කළ යුතුය.

මෙම ඉල්ලුම්පත සම්පූර්ණ කරනු ලබන්නේ 1. සිංහල භාෂාවෙනි ☐ 2. දෙමළ භාෂාවෙනි ☐ 3. ඉංග්‍රීසි භාෂාවෙනි ☐
(අදාල කොටුවේ "✓" ලකුණ යොදන්න)

2. ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

3. ඉල්ලුම්කරුගේ නම

| 3.1 | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පෙළපත් නාමය | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |
| නම | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |
| වාසගම | | | | | | | | | | | | | | | | | |

නම ඉංග්‍රීසි කැපිටල් අකුරින්

| 3.2 | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පෙළපත් නාමය | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |
| නම | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |
| වාසගම | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |

ජාතික හැඳුනුම්පතෙහි සඳහන් විය යුතු නම 3.1 හි සඳහන් නමට වඩා වෙනස් වන්නේ නම් පමණක් එම නම මෙහි සඳහන් කරන්න.

| 3.3 | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පෙළපත් නාමය | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | |
| | නම | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | |
| | වාසගම | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | |

4. ස්ත්‍රී/පුරුෂ බව [ ]

5. සිවිල් තත්ත්වය (විවාහක/අවිවාහක/වැන්දඹු/දික්කසාද) [ ]

6. ඉල්ලුම්කරුගේ උපත පිළිබඳ විස්තර

| 6.1 | උපන් දිනය | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

| 6.2 | උප්පැන්න සහතිකයේ අංකය | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 6.3 | උපන් ස්ථානය | | | | | | | | | | | | | | | | | |
| 6.4 | කොට්ඨාසය | | | | | | | | | | | | | | | | | |
| 6.5 | දිස්ත්‍රික්කය | | | | | | | | | | | | | | | | | |

ශ්‍රී ලංකාව හැර පිටත උපන් තැනැත්තකු ලියාපදිංචි කර නිකුත් කරනු ලබන සහතිකයේ සඳහන් පරිදි පහත විස්තර සටහන් කරන්න.

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 6.6 | උපන් රට | | | | | | | | | | | | | | | | | |
| 6.7 | නගරය | | | | | | | | | | | | | | | | | |
| 6.8 | සහතිකයේ අංකය | | | | | | | | | | | | | | | | | |

7. පදිංචිය පිළිබඳ විස්තර

ස්ථිර පදිංචිය

| 7.1 | නිවසේ නම හෝ අංකය | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පටුමග/පෙදෙස/උද්‍යානය | | | | | | | | | | | | | | | |
| | පාර/වීදිය | | | | | | | | | | | | | | | |
| | ගම | | | | | | | | | | | | | | | |
| | නගරය | | | | | | | | | | | | | | | |
| | තැපැල් කේතය | | | | | | | | | | | | | | | |

තාවකාලික පදිංචිය

| 7.2 | නිවසේ නම හෝ අංකය | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පටුමග/පෙදෙස/උද්‍යානය | | | | | | | | | | | | | | | |
| | පාර/වීදිය | | | | | | | | | | | | | | | |
| | ගම | | | | | | | | | | | | | | | |
| | නගරය | | | | | | | | | | | | | | | |
| | තැපැල් කේතය | | | | | | | | | | | | | | | |

8. සම්බන්ධීකරණ තොරතුරු

දුරකථන අංකය

| නිවස | ජංගම |
|---|---|
| | |

| | |
|---|---|
| විද්‍යුත් තැපැල | |

9. රැකියාව/ වෘත්තීය

| | | | |
|---|---|---|---|
| 9.1 | | 9.2 | |

10. පවුලේ විස්තර

පියාගේ විස්තර

| | | |
|---|---|---|
| 10.1 | පෙළපත් නාමය | |
| | නම | |
| | වාසගම | |
| | උපන් දිනය | |
| | ජාතික හැඳුනුම්පත් අංකය | |

මවගේ විස්තර

| | | |
|---|---|---|
| 10.2 | පෙළපත් නාමය | |
| | නම | |
| | වාසගම | |
| | උපන් දිනය | |
| | ජාතික හැඳුනුම්පත් අංකය | |

භාරකරුගේ විස්තර

| | | |
|---|---|---|
| 10.3 | පෙළපත් නාමය | |
| | නම | |
| | වාසගම | |
| | උපන් දිනය | |
| | ජාතික හැඳුනුම්පත් අංකය | |

කලත්‍රයාගේ විස්තර

| | | |
|---|---|---|
| 10.4 | පෙළපත් නාමය | |
| | නම | |
| | වාසගම | |
| | උපන් දිනය | |
| | ජාතික හැඳුනුම්පත් අංකය | |

11. සහෝදර සහෝදරියන්ගේ තොරතුරු *

11.1 සහෝදර සහෝදරියන් ගණන

| අංකය | | 11.2 සම්පූර්ණ නම | 11.3 (පි/ගැ) | 11.4 උපන් දිනය හා ජාතික හැඳුනුම්පත් අංකය | 11.5 වි/අවි/වැන්/ | 11.6 (✓/x) |
|---|---|---|---|---|---|---|
| 1 | 1.1 | | | | | |
| | 1.2 | | | | | |
| | 1.3 | | | | | |
| 2 | 2.1 | | | | | |
| | 2.2 | | | | | |
| | 2.3 | | | | | |
| 3 | 3.1 | | | | | |
| | 3.2 | | | | | |
| | 3.3 | | | | | |
| 4 | 4.1 | | | | | |
| | 4.2 | | | | | |
| | 4.3 | | | | | |
| 5 | 5.1 | | | | | |
| | 5.2 | | | | | |
| | 5.3 | | | | | |
| 6 | 6.1 | | | | | |
| | 6.2 | | | | | |
| | 6.3 | | | | | |
| 7 | 7.1 | | | | | |
| | 7.2 | | | | | |
| | 7.3 | | | | | |
| 8 | 8.1 | | | | | |
| | 8.2 | | | | | |
| | 8.3 | | | | | |

* සහෝදර සහෝදරියන් ගණන 8 ක් ඉක්මවන්නේ නම්, අතිරේකව ලබා දෙනු ලබන 5 - 1 පිටුව සම්පූර්ණ කරන්න.

12. දරුවන්ගේ තොරතුරු *

12.1 දරුවන් ගණන

| අංකය | | 12.2 සම්පූර්ණ නම | 12.3 (පි/ගැ) | 12.4 උපන් දිනය හා ජාතික හැඳුනුම්පත් අංකය | 12.5 වි/අවි/වැන්/ | 12.6 (✓/x) |
|---|---|---|---|---|---|---|
| 1 | 1.1 | | | | | |
| | 1.2 | | | | | |
| | 1.3 | | | | | |
| 2 | 2.1 | | | | | |
| | 2.2 | | | | | |
| | 2.3 | | | | | |
| 3 | 3.1 | | | | | |
| | 3.2 | | | | | |
| | 3.3 | | | | | |
| 4 | 4.1 | | | | | |
| | 4.2 | | | | | |
| | 4.3 | | | | | |
| 5 | 5.1 | | | | | |
| | 5.2 | | | | | |
| | 5.3 | | | | | |
| 6 | 6.1 | | | | | |
| | 6.2 | | | | | |
| | 6.3 | | | | | |
| 7 | 7.1 | | | | | |
| | 7.2 | | | | | |
| | 7.3 | | | | | |
| 8 | 8.1 | | | | | |
| | 8.2 | | | | | |
| | 8.3 | | | | | |

* දරුවන් ගණන 8 ක් ඉක්මවන්නේ නම්, අතිරේකව ලබා දෙනු ලබන 6 - 1 පිටුව සම්පූර්ණ කරන්න.

13. ඉල්ලුම්කරුගේ ප්‍රකාශය

(සම්පූර්ණ නම සඳහන් කරන්න)

.................................................................................................................................................................

......................................................................................... වන මම, ඉහත සඳහන් පනතේ 11 වැනි වගන්තිය යටතේ ලියාපදිංචි වීම සඳහාත් 2016 අංක 08 දරන පනතේ 32 වගන්තිය යටතේ නැවත ලියාපදිංචි වීම සඳහාත්, 14 වැනි වගන්තිය යටතේ ජාතික හැඳුනුම්පතක් නිකුත් කරනු ලැබීම සඳහාත්, එම පනතේ 09 වැනි වගන්තිය යටතේ 2016 අංක 08 දරන පනතේ 32 වගන්තිය යටතේ මෙයින් ඉල්ලුම් කරමි.

අ. ඉහත නම සඳහන් මා ශ්‍රී ලංකාවේ පුරවැසියකු බවත් මෙම පනත යටතේ ලියාපදිංචි වීමට/නැවත ලියාපදිංචි වීමට හිමිකම් ඇති බවත්, මෙම ඉල්ලුම්පත සමග ඉදිරිපත් කර ඇති සියලු තොරතුරු හා ලිපි ලේඛන මා දන්නා පරිදි සත්‍ය හා නිවැරදි බවත්, මේ සමග ඉදිරිපත් කරන ඡායාරූප හා ඇඟිලි සටහන් මාගේ බවත්, මෙයින් සහතික කර ප්‍රකාශ කරමි.

ආ. මාගේ පවුලේ දරු උපතක් සිදුවුවහොත් ද, විවාහයක්, දික්කසාද වීමක්, වෙන්වීමක්, පැවැදි වීමක් උපැවිදි වීමක් හෝ දරුවකු දරු කමට හදා ගැනීමක් සිදුවුව හොත් ඒ බව ''ඒ'' ආකෘතිය මගින් දන්වා සිටීමේ වගකීම මම භාර ගනිමි.

ඇ. මෙම ඉල්ලුම්පත අනුව මා වෙත නිකුත් කරනු ලබන ජාතික හැඳුනුම්පතේ වලංගු කාලසීමාව ඉකුත් වූ පසු එය අලුත් කරවා ගැනීමට හෝ පනතේ 17(1) වගන්තියේ සඳහන් යම් තත්වයක දී එකී වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සංශෝධිත අනුපිටපතක් ලබා ගැනීමට පියවර ගන්නා බවට ද මෙයින් පොරොන්දු වෙමි.

.....................................

දිනය

ඉල්ලුම්කරුගේ අත්සන හෝ වම් මහපටැඟිලි සලකුණ

14. සහතික කිරීමේ නිලධාරියාගේ සහතිකය

පරිලෝකනය කිරීම සඳහා ඉල්ලුම්කරුගේ ඡායාරූපය මෙහි අලවන්න

ඉල්ලුම්කරුගේ ඡායාරූපය මේ සමග අලවන්න

සහතික කිරීමේ නිලධාරිගේ අත්සන හා නිල මුද්‍රාව

ඉහත අංක 07 හි සඳහන් ලිපිනයේ පදිංචි ......................................................................................................................

.............................................................................. ගේ ඉහත දක්වෙන ඡායාරූප වෙස් මාරු කිරීම් වලින් හෝ සැඟ වීම්වලින් තොරව අයදුම්කරුගේ ස්වභාවික තත්වය පිළිබිඹු කෙරෙන බවත්, මෙම ඉල්ලුම්කරුගේ ඇඟිලි සටහන් මා ඉදිරිපිට දී ඇඟිලි සටහන් පත්‍රයේ තබන ලද බවත් මෙයින් සහතික කරමි. ඒ බව සනාථ කිරීම සඳහා ඉහත දක්වෙන සසඳා බැලීමේ ඡායාරූපය මත හා ඇඟිලි සටහන් පත්‍රයේ මාගේ අත්සන සහ නිල මුද්‍රාව තබා ඇති බව ද සහතික කරමි.

මෙම ඉල්ලුම් පත්‍රයේ සම්පූර්ණ කර නොමැති තොරතුරු පිළිබඳ නිරීක්ෂණ

සහතික කිරීමේ නිලධරයාගේ

| | |
|---|---|
| නම | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජාතික හඳුනුම්පත් අංකය | | | | | | | | | | | |

අත්සන හා නිල මුද්‍රාව

ප්‍රාදේශීය ලේකම්වරයාගේ අත්සන හා නිල මුද්‍රාව

1968 අංක 32 දරන පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නිකුත් කරන කුවිතාන්සිය

QR Code

.............................................................................................................................................. හිමි/පියතුමා/මහතා/මිය/මෙය විසින් ජාතික පුද්ගල නාම ලේඛනයේ ලියාපදිංචි වීම හා විද්‍යුත් ජාතික හැඳුනුම්පතක් ලබා ගැනීම සඳහා අදාළ ලියවිලි සමග ඉදිරිපත් කරන ලද අංක ....................................... දරන අයදුම්පත පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් වෙත යැවීම සඳහා ............................................ දින මා විසින් භාරගත් බව මෙයින් සහතික කර සිටිමි.

.................................................... සහතික කිරීමේ නිලධරයාගේ අත්සන

...................................................................... සහතික කිරීමේ නිලධරයාගේ නිල මුද්‍රාව

## පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

### ඉල්ලුම් පත්‍රය පිරවීම සඳහා උපදෙස්

* ඉල්ලුම්පත පිරවීමට අවශ්‍ය උපදෙස් ඉල්ලුම්පත්‍රයේ අංකවලට සමාන අංක යටතේම මෙහි සපයා ඇත.

* ඉල්ලුම්පත පිරවීමේදී සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන එක් භාෂාවක් භාවිතා කරන්න. එසේ වුව ද ඉල්ලුම්පතේ අංක 3.2 ඉංග්‍රීසි භාෂාවෙන් ම පමණක් පිරවිය යුතු ය.

* ඉල්ලුම්පත පිරවීම සඳහා නිල් බෝල්පොයින්ට් පෑනක් පමණක් භාවිත කරන්න.

* ඉල්ලුම්පත පැහැදිලි අත් අකුරින් පුරවන්න.

* මෙම අයදුම්පත සමග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ඡායාරූප ශිල්පියෙකුගෙන් ලබා ගන්නා ලද ඡායාරූප තුනක් ඉදිරිපත් කළ යුතු ය.

1. අංක 1 යටතේ විස්තර ග්‍රාම නිලධාරි විසින් පිරවිය යුතු ය. 1.1 - පරිපාලන දිස්ත්‍රික්කය, 1.2 - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, 1.3 - ග්‍රාම නිලධාරි වසම හා එහි අංකය සටහන් කරන්න. 1.4 - අදළ කොටු වල QR ස්ටිකර් ඇලවිය යුතු ය.
2. ඔබ දැනමටත් ජාතික හැඳුනුම්පතක් ලබාගෙන තිබේ නම්, එහි අංකය මෙහි සඳහන් කරන්න. ජාතික හැඳුනුම්පතක් ලබාගෙන තිබුණ ද එහි අංකය සොයා ගැනීමට නොහැකි නම් "නොදනිමි" යනුවෙන් ද හැඳුනුම්පතක් ලබාගෙන නොමැති නම් " ලබාගෙන නොමැත" යනුවෙන් ද අදළ කොටුව තුළ සටහන් කරන්න.

3. ඉල්ලුම්කරුගේ විස්තර ඃ

* අංක 3.1 පහත ආදර්ශය අනුව, උප්පැන්න සහතිකයේ/අනුමාන වයස් සහතිකයේ/පුරවැසි සහතිකයේ/පූජ්‍යත්වය සහතික කරන සහතිකය/දරුකමට හදා ගැනීමේ සහතිකය සඳහන් පරිදි නම පිරවිය යුතු ය.

* "පුරවැසි සහතිකය" යනු - 1948 අංක 18 දරන පුරවැසි පනතට අනුව ලියාපදිංචි වීමෙන් පුරවැසිභාවය ලබා ගන්නා ලද සහතිකය හෝ ඉන්දියානු සම්භවයක් ඇති තැනැත්තන් ඒ සඳහා ඇති පනත්වල විධිවිධාන ප්‍රකාරව ලියාපදිංචිකොට නිකුත් කරන ලද සහතිකය හෝ 2008 අංක 38 දරන චීන සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත යටතේ ලියාපදිංචි වීමෙන් පුරවැසිභාවය ලබා ගන්නා ලද සහතිකය

ඉල්ලුම්කරුගේ නම පිරවීම සඳහා ආදර්ශය - 01

3.1

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පෙළපත් නාමය/ குடும்பப் பெயர்/ Family Name | ද | ඔ | වි | න් | නේ | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |
| නම/பெயர்/Name | ර | ත | න | ජෝ | ති | | හි | මි | | | | | | | | | |
| වාසගම/ முதற் பெயர்/Surname | | | | | | | | | | | | | | | | | |

3.1

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පෙළපත් නාමය/ குடும்பப் பெயர்/ Family Name | අ | ම | න් | දු | ව | හේ | ව | ගේ | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |
| නම/பெயர்/Name | සු | ස | න් | ත | | | | | | | | | | | | | |
| වාසගම/ முதற் பெயர்/Surname | ගු | ණ | ව | ර් | ධ | න | | | | | | | | | | | |

3.1

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පෙළපත් නාමය/ குடும்பப் பெயர்/ Family Name | පි | ය | ද | ස | ගේ | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |
| නම/பெயர்/Name | ච | මි | න් | ද | | | | | | | | | | | | | |
| වාසගම/ முதற் பெயர்/Surname | | | | | | | | | | | | | | | | | |

3.1

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පෙළපත් නාමය/ குடும்பப் பெயர்/ Family Name | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |
| නම/பெயர்/Name | නි | ල | න් | ත | | | | | | | | | | | | | |
| වාසගම/ முதற் பெயர்/Surname | ද | | සි | ල් | වා | | | | | | | | | | | | |

| 3.1 | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පෙළපත් නාමය/ குடும்பப் பெயர்/ Family Name | මො | හො | ම | ඩ් | | ජ් | ස් | මි | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |
| නම/ பெயர்/Name | පා | ති | මා | | න | ස් | රි | න් | | | | | | | | | |
| වාසගම/ முதற் பெயர்/Surname | | | | | | | | | | | | | | | | | |

| 3.1 | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පෙළපත් නාමය/ குடும்பப் பெயர்/ Family Name | ත | ත්‍යා | ග | රා | සා | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |
| නම/ பெயர்/Name | | | | | | | | | | | | | | | | | |
| වාසගම/ முதற் பெயர்/Surname | කු | ග | ද | ස | න් | | | | | | | | | | | | |

* නම සනාථ කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ලේඛන ඃ

* සම්පූර්ණ නම සනාථ කිරීම සඳහා උප්පැන්න සහතිකය/අනුමාන වයස් සහතිකය/පුරවැසි සහතිකය/පූජ්‍යත්ව සහතිකය/ දරුකමට හදා ගැනීමේ සහතිකය
* පූජ්‍ය/පූජක පක්ෂය පූජ්‍යත්වය සනාථ කරන සහතිකයට අමතරව උප්පැන්න සහතිකය ද ඉදිරිපත් කළ යුතු ය.

* උප්පැන්න සහතිකය හෝ අනුමාන වයස් සහතිකය නොමැති නම්
දෙමාපියන්ගේ නම් ඉල්ලුම්කරුගේ නම්, උපන් දිනය හා උපන් ස්ථානය සහිත දිව්රුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු අතර පහත සඳහන් ලේඛන වලින් එකක් හෝ කිහිපයක් ඉදිරිපත් කළ යුතු ය

* පාසල් හැරයාමේ සහතිකය
* උපසම්පදා/සාමණේර /බෞතීස්ම සහතිකය
* දරුවන්ගේ උප්පැන්න සහතිකයක පිටපතක්
* විවාහ සහතිකය
* ලේඛන සෙවීමේ ප්‍රතිඵල සහතිකය
* සම්ප්‍රදායානුකූලව සකසන වේලාපත්කඩය/හඳහන/කේන්දරය

* ඉල්ලුම්පතේ අංක 3.2 යටතේ අයදුම්කරුගේ නම උප්පැන්න සහතිකයේ /අනුමාන වයස් සහතිකයේ/පුරවැසි සහතිකයේ / පූජකත්වය සනාථ කරන සහතිකයේ/දරුකමට හදා ගැනීමේ සහතිකයේ සඳහන් පරිදි නම ඉංග්‍රීසි කැපිටල් අකුරින් පහත ආදර්ශය 02 අනුව පිරවිය යුතු ය.

ඉල්ලුම්කරුගේ නම ඉංග්‍රීසි කැපිටල් අකුරින් සඳහා ආදර්ශය - 02

| 3.2 | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Family Name | D | A | M | B | A | V | I | N | N | E | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |
| Name | R | A | T | H | N | A | J | O | T | H | I | T | H | E | R | O | |
| Surname | | | | | | | | | | | | | | | | | |

| 3.2 | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Family Name | A | L | U | T | H | D | U | W | A | | H | E | W | A | G | E | |
| | | | | | | | | | | | | | | | | | | |
| | Name | S | U | S | A | N | T | H | A | | | | | | | | | |
| | Surname | G | U | N | A | W | A | R | D | E | N | E | | | | | | |

| 3.2 | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Family Name | P | I | Y | A | D | A | S | A | G | E | | | | | | | |
| | | C | H | A | M | I | N | D | A | | | | | | | | | |
| | Name | | | | | | | | | | | | | | | | | |
| | Surname | | | | | | | | | | | | | | | | | |

| 3.2 | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Family Name | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | |
| | Name | N | I | L | A | N | T | H | A | | | | | | | | | |
| | Surname | D | E | | S | I | L | V | A | | | | | | | | | |

| 3.2 | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Family Name | M | O | H | A | M | E | D | | J | I | S | M | Y | | | | |
| | | | | | | | | | | | | | | | | | | |
| | Name | F | A | T | H | I | M | A | | N | A | Z | R | E | E | N | | |
| | Surname | | | | | | | | | | | | | | | | | |

අංක 3.3 යටතේ හැඳුනුම්පතට අතුළත් විය යුතු නම 3.1 ට වඩා වෙනස් වන්නේ නම් පමණක් එම නම සඳහන් කරන්න. ඒ සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන්න.

4. ස්ත්‍රී/පුරුෂ භාවය පිරවීමේ දී ඔබ පිරිමි අයෙකු නම් ඉංග්‍රීසි කැපිටල් ''M'' අක්ෂරය ද, ගැහැණු අයෙකු නම් ඉංග්‍රීසි කැපිටල් '' F'' අක්ෂරයද අදාළ කොටුව තුළ සටහන් කරන්න.
5. විවාහක/අවිවාහක භාවය :- විවාහක අයෙකු නම් ඉංග්‍රීසි ''M '' අක්ෂරය ද, අවිවාහක අයෙකු නම ඉංග්‍රීසි කැපිටල් ''S'' අක්ෂරය ද, වැන්දඹු අයෙකු නම් '' W'' අක්ෂරය ද, දික්කසාද අයෙකු නම් ඉංග්‍රීසි ''D '' අදාළ කොටුව තුළ සටහන් කරන්න.
6. උපත පිළිබඳ තොරතුරු ආදර්ශ 03 ට අනුව පුරවන්න.

අංක 6.1 යටතේ, උපන් දිනය සඳහන් කරන්න. අනුමාන වයස් සහතිකයක් ඉදිරිපත් කරන අවස්ථා වලදී, උපන් දිනය සනාථ කිරීම සඳහා ලිඛිත සාක්ෂියක් ඉදිරිපත් කරන්න.

* අංක 6.2 යටතේ උප්පැන්න සහතිකයේ අංකය
* අංක 6.3 යටතේ උපන් ස්ථානය
* අංක 6.4 යටතේ උප්පැන්න සහතිකයේ සඳහන් කොට්ඨාසය
* අංක 6.5 යටතේ උප්පැන්න සහතිකයේ සඳහන් දිස්ත්‍රික්කය

ඔබ ශ්‍රී ලංකාවෙන් බැහැර වෙනත් රටක උපත ලැබුවේ නම් එම රටේ උපන් තැනැත්තකු සඳහා නිකුත් කරනු ලබන ලියාපදිංචි කිරීමේ සහතිකයට අනුව පුරවන්න.

* අංක 6.6 යටතේ, උපත ලැබූ රට
* අංක 6.7 යටතේ උපත ලැබූ නගරය
* අංක 6.8 යටතේ සහතිකයේ සඳහන් අංකය

උපත පිළිබඳ තොරතුරු පිරවීම සඳහා ආදර්ශය - 03

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 6.1 | උපන් දිනය/பிறந்த திகதி/Date of Birth | 1 | 9 | 7 | 6 | 1 | 1 | 2 | 4 |
| 6.2 | උප්පැන්න සහතිකයේ අංකය/பிறப்பு அத்தாட்சிப் பத்திரத்தின் இலக்கம்/Birth Certificate No. | 1 | 2 | 6 | 7 | | | | |

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 6.3 | ස්ථානය/பிறந்த இடம்/Place of Date | ම | හ | මෝ | ද | ර | | රෝ | හ | ල | | | | | | | | | | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 6.4 | කොට්ඨාසය/பிறந்த பிரிவு/Division | ගා | ල් | ල | | | | | | | |
| 6.5 | දිස්ත්‍රික්කය/பிறந்த மாவட்டம்/District | ගා | ල් | ල | | | | | | | |

ශ්‍රී ලංකාවේ බැහැර වෙනත් රටක උපත ලැබුවේ නම් එම උපත ලියාපදිංචි කිරීම පිළිබඳ විස්තර

| | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 6.6 | උපන් රට/பிறந்த நாடு/ Birth Country | එ | ක් | ස | ත් | | අ | රා | බි | | එ | මී | ර් | | රා | ජ | ය | ය | | | |
| 6.7 | නගරය/நகரம்/City | ඩු | බා | යි | | | | | | | | | | | | | | | | | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 6.8 | සහතිකයේ අංකය/சான்றிதழின் இலக்கம்/Certificate No. | 1 | 3 | 0 | 0 | 1 | 2 | 8 | 7 | 1 | 0 |

7.1 පදිංචිය පිළිබඳ විස්තර.

* අංක 7.1 ලිපිනය :- ස්ථිර පදිංචි ලිපිනය පිළිබඳව ආදර්ශය - 04

| | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 7.1 | අංකය/இலக்கம்/No. | 2 | 1 | 0 | / | 0 | 3 | / | 0 | 4 | | | | | | | | | | | |
